**10 ශ්‍රේණිය.**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**දෙවෙනි වාරය - පස්වෙනි සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

- ඔබගේ පෙළ පොතෙහි 60වන පිටුවෙහි ඇතුළත් කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය පාඩම හොඳින් කියවන්න.
- වාක්‍යයක ඇති කර්තෘ, කර්මය හා ක්‍රියාව හොඳින් හඳුනාගන්න.
- කර්තෘකාරක වාක්‍යයක හා කර්මකාරක වාක්‍යයක ඇති ලක්ෂණ වෙන වෙන ම හඳුනාගන්න.
- පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරයට නඟන්න.
    1. අම්මා බත් පිසියි.
    2. සේවකයා වත්ත පිරිසිදු කරයි.
    3. වෛද්‍යවරයා රෝගීන් සුවපත් කරයි
    4. වැද්දෝ මුවන් මරති.
    5. බල්ලෝ සාවුන් අල්ලති.
- පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරයට නඟන්න.
    1. ගායකයන් විසින් ගී ගයනු ලැබේ.
    2. ගුරුවරුන් විසින් යහපත් මිනිස්සු නිර්මාණය කෙරෙති.
    3. දියණිය විසින් මිදුල අමදිනු ලැබේ.
    4. විදුහල්පතිතුමා විසින් ප්‍රධාන ආරාධිතයා පිළිගනු ලැබීය.
    5. දරුවන් විසින් පොත් කියවනු ලැබේ.

* * *

සැකසුම
ජගත් කුමාර ජයසිංහ
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය